# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1981 ජූලි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 65 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 2 වන දින]

එල්.ඩී.—ඕ. 38/80

**ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු කීපය මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන අර්ථසිද්ධිය සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම.

**2.** (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, සංස්ථාව විසින් හා සංස්ථාවට විරුද්ධව එම නාමයෙන් සියලුම අධිකරණයන්හි නඩු පැවරීම හෝ පවරනු ලැබීම කළ යුතු ය; එමෙන්ම කරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද එය සංස්ථාවේ කැමැත්ත අනුව වෙනස් කිරීමට ද සංස්ථාවට සම්පූර්ණ බලය සහ අධිකාරය ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාවේ පොදු පරමාර්ථ වූ කලී—

(අ) සංස්ථාවේ සාමාජිකයන් අතර නිෂ්පාදන සහ නිෂ්පාදිත ද්‍රව්‍ය හෝ සකස් කරන ලද ද්‍රව්‍ය සහ බඩු විකිණීම, මිලදී ගැනීම හෝ නැව්ගත කිරීම පිළිබඳ සියලුම සංඛ්‍යා ලේඛන එකතු කිරීමෙන් හා දුක්ගැනවිලි ගැන සහනයක් සෙවීමෙන් ශ්‍රී ලංකාවේ වෙළෙඳාම වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ ආරක්ෂා කිරීම;

2—ඒ 54744—12,225 (81/01)

(ආ) සියලුම වාණිජ ප්‍රශ්න හෝ ඒ හා සම්බන්ධිත කරුණු සම්බන්ධයෙන් වූ දැනුම සහ තොරතුරු හා අදහස් හුවමාරුව දිරිගැන්වීම, පුළුල් කිරීම, ව්‍යාප්ත කිරීම හා වැඩිදියුණු කිරීම සහ එහි සාමාජිකයන් පුහුණු කිරීමට, ඔවුනට සහාය වීමට හා උපදෙස් දීමට මධ්‍ය සංවිධානයක් පිහිටුවීම ;

(ඇ) කාර්මික සුභසාධන කටයුතු, කාර්ය මණ්ඩල කළමනාකරණය සහ සේවා නියුක්ති පරිපාලනය ද ඇතුළුව, කළමනාකරණ විද්‍යාව ප්‍රවර්ධනය කිරීම, අනුබල දීම සහ දියුණු කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ වෙළෙඳාමට, නිෂ්පාදනවලට සහ කර්මාන්තවලට සම්බන්ධ සියලු ප්‍රශ්න සලකා බැලීම ඒවාට බලපාන ව්‍යවස්ථාදායකත්වය සහ වෙනත් පියවර ගැනීම ප්‍රවර්ධනය හෝ ඒ සම්බන්ධයෙන් නියෝජනයන් කිරීමට උත්සාහ ගැනීම සහ ඒ හා සම්බන්ධ සංඛ්‍යා ලේඛන සහ වෙනත් තොරතුරු රැස්කිරීම හා සංසරණය කිරීම ;

(ඉ) සමීක්ෂකයන් පත් කිරීම සහ බඩු සහ වෙළෙඳ බඩු සමීක්ෂණය කිරීම සඳහා සහ සමීක්ෂණ වාර්තා, මූලාරම්භ සහතික, බර සහ පරිමාණ පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඊ) කම්කරු නීති සහ නියෝග පිළිබඳව සාමාජිකයන්ට උපදෙස් දීම සහ සහාය දීම සහ කම්කරු විනිශ්චය සභා, අධිකරණ, කම්කරු දෙපාර්තමේන්තුව හෝ වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ බලමණ්ඩලයක් ඉදිරිපිට පැවැත්වෙන කම්කරු ආරාවුල්වල දී සාමාජිකයන් වෙනුවෙන් පෙනී සිටීම සහ ඔවුන්ට නීති සහාය පිළියෙළ කර දීම ;

(උ) බේරුම් කිරීමේ මණ්ඩලයේ තීරණවලින් බැඳීමට කැමති, සාමාජිකයන් සඳහා බේරුම් කිරීමේ මණ්ඩලයක් පිහිටුවීම සහ වෙළෙඳාමෙන්, වාණිජ හා කර්මාන්ත කටයුතුවලින් පැන නැගෙන ආරාවුල් සහ මත භේද නිරවුල් කිරීමට භාර ගැනීම ;

(ඌ) දේශන, පන්ති සහ විභාග පැවැත්වීම සඳහාත් කළමනාකරණය සම්බන්ධ ශිෂ්‍යත්ව සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහාත් පහසුකම් සැලසීම මෙන්ම කුශලතා සහතික නිකුත් කිරීම සහ විධායකයන් ලෙස නියුක්තව සිටින තැනැත්තන් තුළ වැඩි කාර්යක්ෂමතාවක් ඇති කිරීමට දිරිගැන්වීම ;

(එ) වාණිජ වෘත්තීන් සඳහා පුහුණුවක් ලැබීමට කැමති තැනැත්තන්ට සහාය දීම සඳහා ශිෂ්‍යත්ව පිහිටුවීම සහ එවැනි යම් කාර්යයක් සඳහා ආධාර සහ පරිත්‍යාගයන් භාර ගැනීම, එවැනි යම් කාර්යයක් සඳහා යම් මුදලක් ආධාර වශයෙන් හෝ පරිත්‍යාගයක් වශයෙන් ලත් යම් අරමුදලක භාරකරුවන්, ආරක්ෂකයන් සහ කළමනාකරුවන් ලෙස ක්‍රියා කිරීම සහ සාමාන්‍යයෙන්, යම් භාරයක් පිළිබඳ වගකීම පිළිගැනීම හා එය ක්‍රියාත්මක කිරීම සහ භාරකාර ධුරය පිළිගැනීම ;

(ඒ) සේවා නියුක්තයන් බඳවා ගැනීම සහ පුහුණු කිරීම සඳහා වෙළෙඳ, වාණිජ සහ කර්මාන්ත සේවා යෝජකයන්ට පහසුකම් සැලසීම ;

(ඔ) සංස්ථාවේ වැඩකටයුතු සහ වාර්තා හෝ ඒ හා සම්බන්ධිත යම් ලියවිලි, ප්‍රකාශ, සංඛ්‍යාලේඛන, පාඨ ග්‍රන්ථ, නිබන්ධන හෝ විෂයයන් සිංහලෙන්, දෙමළෙන් හෝ වෙන යම් භාෂාවකින් සම්පාදනය කිරීම, මුද්‍රණය කිරීම, පළ කිරීම, බෙහැර දීම හෝ බෙදා හැරීම සහ කර්මාන්ත, වෙළෙඳාම කළමනාකරණය සහ ඊට සමාන විෂයයන්ට අදාළ පොත පතින් යුත් පුස්තකාලයක් පිහිටුවීම ;

(ඕ) නිෂ්පාදනය සහ වෙළෙඳාම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සපයන්නෝ විය හැකි තැනැත්තන් සහ ගැනුම්කරුවන් විය හැකි තැනැත්තන් අතර සම්බන්ධතාවයක් ඇති කිරීම සහ අමු ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ආනයන බල පත්‍ර හා සහනදායක ආනයන බදු ප්‍රමාණ ඉල්ලා සිටීම ;

(ක) වෙළෙඳ පොළ සමීක්ෂණ කිරීම සහ දේශීය කාර්මික සහ වෙනත් නිෂ්පාදන අපනයන ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ අපනයන ආයතන සහ වෙනත් රටවල ආනයනකරුවන් ගේ මාර්ගයෙන් සාකච්ඡා පැවැත්වීම ;

(ග) සංස්ථාවේ සාමාජිකයන් වෙනුවෙන් හා ඔවුන් සඳහා ආණ්ඩුව සහ වෙනත් සංවිධාන සමග මහජන සම්බන්ධතා පවත්වා ගෙන යාම සහ පාරිභෝගික සභා සංවිධානය කිරීම සහ සාමාජිකයන්ගේ නිෂ්පාදන ගැන ප්‍රසිද්ධියක් ලබා දීම ;

(ච) අමු ද්‍රව්‍ය වැවීමේ කාර්යය සඳහා සුදුසු ඉඩම් ලබා ගැනීම පිණිස ආණ්ඩුව සමග සාකච්ඡා පැවැත්වීම සහ එම කාර්යය සඳහා සුදුසු ඉඩම් ලබා ගැනීම ;

(ජ) සම්පූර්ණයෙන්ම හෝ කොටසක්, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ වෙන යම් සංගමයකට, පුද්ගලයකුට, ව්‍යාපාරික ආයතනයකට හෝ මණ්ඩලයකට දායකවීම, එහි සාමාජික යන් වීම, ඊට සහනාධාර දීම සහ ඒ සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනයට තුඩු දිය හැකි යම් තොරතුරක්, කරුණක්, අයිතිවාසිකමක් හෝ දෙයක් එම සංගමයෙන්, පුද්ගලයාගෙන්, ව්‍යාපාරික ආයතනයෙන් හෝ මණ්ඩලයෙන් ලබා ගැනීම හෝ ඊට දැනුම් දීම ;

(ට) සංස්ථාවේ පරමාර්ථ හා අරමුණුවලට සමාන පරමාර්ථ හා අරමුණු ඇත්තා වූ දේශීය හෝ විදේශීය වෙනත් යම් සංවිධානාත්මක මණ්ඩලයක් හෝ විශේෂිත නියෝජ්‍ය යතනයක් සමග අනුබද්ධ වීම, සහයෝගීව ක්‍රියා කිරීම, ඒකාබද්ධ වීම, සහ ශ්‍රී ලංකාවේ නොයෙක් නොයෙක් ප්‍රදේශවල ශාඛා පිහිටුවීම සහ සංස්ථාව සමග අනුබද්ධ

වීම සඳහා හෝ සංස්ථාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ආකාරයෙන් ඒ ශාඛා පාලනය කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම සහ ඒවාට සහාය දීම සහ සංස්ථාවේ අභිමතය පරිදි ඒ ශාඛා අවලංගු කිරීම, වසා දැමීම හෝ අන්‍යාකාරයකින් අවසාන කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ඩ) ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්තවල ස්වාර්ථයට හෝ යහපතට හෝ ඉහත කී පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ වෙළෙඳාම, වාණිජ්‍යය, නිෂ්පාදන සහ කර්මාන්ත යන කට යුතුවල යහපත, ආරක්ෂාව හෝ ප්‍රගතිය සඳහා හෝ අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේවල් කිරීම.

සංස්ථාවේ බලතල.

4. (1) සංස්ථාවට පහත සඳහන් බලතල ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා කොන්දේසි රහිතව හෝ කොන්දේසි සහිතව, දායක මුදල් සහ සියලු ආකාරයේ තෑගි ඉල්ලීම සහ පිළිගැනීම;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඇ) සංස්ථාවේ මුදල් හෝ සංස්ථාවට භාරදෙනු ලබන ඕනෑම මුදලක් (නිශ්චල දේපළ උකස් කිරීම් ද ඇතුළුව) සංස්ථාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ආයෝජනවල, එසේම තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඈ) මිලට ගැනීමක, හුවමාරුවක, ත්‍යාගයක, තෙස්තමේන්තු නියාදනයක ප්‍රකාර හෝ අන් ආකාරයකින් යම් කවර හෝ දේපළක් අත් කර ගැනීම සහ එවැනි දේපළ විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන හෝ සංස්ථාවේ කාර්ය මණ්ඩලයට නිවාස සැපයීම සඳහා අවශ්‍ය වන යම් ගොඩනැගිලි ඉදි කිරීම, වෙනස් කිරීම සහ නඩත්තු කිරීම;

(ඊ) අවශ්‍යයයි සංස්ථාව විසින් සලකනු ලබන සියලුම නිලධරයන් සහ සේවකයන් සංස්ථාවට පත් කිරීම සහ සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසාන කිරීම සහ සංස්ථාව විසින් කලින් කලට තීරණය කරනු ලබන වැටුප්, විශ්‍රාම වැටුප්, පාරිතෝෂික සහ දීමනා ඔවුන්ට ගෙවීම;

(උ) සංස්ථාවේ සිටි හෝ සිටින නිලධරයන්ට හෝ සේවකයන්ට හෝ ඒ තැනැත්තන්ගේ ඥාතීන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට දීමනා, පාරිතෝෂික, විශ්‍රාම වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ දීම පිණිස යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හෝ එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායකවීම;

(ඍ) සුදුසු යයි සංස්ථාව සලකන ආකාරයකින්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා කලින් කල විධිවිධාන සැලැස්වීම, සහ විශේෂයෙන්, සුදුසු යයි සිතන කාර්යය සඳහා සහ නියමයන් උඩ, සංස්ථාවේ ඇටෝර්නි බලකරුවන් හෝ අනුයෝජිතයන් වීමට යම් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කිරීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය සඳහා සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන යම් තැනැත්තෙක්, සමිතියක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමග යම් ගිවිසුමකට ඇතුල්වීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ ඉදිරියට ගෙන යාම පිණිස, යම් දේපළක් සංස්ථාවට දෙනු ලැබුවේ යම් කොන්දේසියකට හෝ භාරයකට යටත්වද, ඒ කොන්දේසිය හෝ භාරය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ නිසි පරිදි සහ කාර්ය සාධක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු දේවල් කිරීම.

(2) සංස්ථාවේ බලතල සියලුම අවස්ථාවන්හි දී, ඒ බලතලවලට අදාළ යම් ලිඛිත නීතිවල විධිවිධානවලට යටත්ව, ක්‍රියාත්මක කළ යුතු ය.

5. (1) සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීති අනුව තෝරා පත් කර ගනු ලබන යම් තැනැත්තන් ගණනකින් සමන්විත වන කළමනාකාර සභාවක් විසින්, සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය. කළමනාකාර සභාව.

(2) මේ පනත ක්‍රියාත්මක වන වේලාවෙහි ධුර දරන මණ්ඩලයේ කළමනාකාර සභාව සංස්ථාවේ ප්‍රථම කළමනාකාර සභාව වන්නේ ය.

6. (1) මේ පනත ක්‍රියාත්මක වන වේලාවේ දී මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුම විසින් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට ඉන් පසුව සාමාජිකයකු ලෙස විධිමත් පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුම විසින් සිය නාමය සටහන් කරවා ගත යුතු ලේඛනයක්, කළමනාකාර සභාව විසින් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය. සාමාජික නාම ලේඛනය.

(2) නාම ලේඛනයෙහි පහත සඳහන් විස්තර අඩංගු විය යුතු ය :—

(අ) එක් එක් සාමාජිකයාගේ නාම, ලිපිනය සහ රක්ෂාව ;

(ආ) සාමාජිකයකු ලෙස යම් තැනැත්තකුගේ නම නාම ලේඛනයේ සටහන් කරන ලද දිනය ; සහ

(ඇ) යම් තැනැත්තකුගේ සාමාජිකත්වය අවසාන වූ දිනය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම හෝ නෙරපීම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නො අඩු ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති, එසේ සෑදීමෙන් පසු, එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන්ම වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ආරම්භ වන දින බල පැවැත්වූ මණ්ඩලයේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද, සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ රීති වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් ඒවා ප්‍රතියෝජනය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදල් සංස්ථාව විසින් ගෙවිය යුතු බව සහ මණ්ඩලයට අයවිය යුතු මුදල් සංස්ථාවට ගෙවිය යුතු බව.

8. මෙම පනත ක්‍රියාත්මක වන වේලාවේ දී පවත්නා වූ මණ්ඩලයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර මණ්ඩලයට අය විය යුතු සියලු ණය, හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ ආදායම සහ දේපළ යෙදවීම.

9. සංස්ථාවේ ආදායම සහ දේපළ හුදෙක් සංස්ථාවේ පරමාර්ථ නංවාලීම පිණිසම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ වෙනත් ලාභ වශයෙන්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නො ලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ විධිවිධාන මගින්—

(අ) සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ සංස්ථාවේ යම් සාමාජිකයකුට, සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන්, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයන් ගෙවීම ;

(ආ) ණයට දෙන ලද මුදලක් වෙනුවෙන් පවතින වාර්ෂික බැංකු පොලී ප්‍රමාණය නොඉක්මවන ප්‍රමාණයක් අනුව පොලී ගෙවීම හෝ සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක ප්‍රාග්ධනයෙන් සියයෙන් එක් කොටසක් නොඉක්මවන කොටස් දරන සාමාජිකයකු වන අවස්ථාවක ඒ සමාගම විසින් සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම ;

(ඈ) තම කටයුතු හෝ යුතුකම් ඉටු කිරීමෙහිලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහිලා, සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් දරන ලද විය දම් නැවත ගෙවීම

වලක්වනු නො ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ බැඳීම් සීමාව.

**10.** සංස්ථාවේ එක් එක් සාමාජිකයකුගේ බැඳීම ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව තුළ උද්ගතවන සංස්ථාවේ ගනු දෙනුවලට සහ ඒ සාමාජිකයාගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදලට හෝ මුදල්වලට වැඩියෙන් රුපියල් දෙසිය පනහක් වූ මුදලකට සීමා විය යුතු ය :

එසේ වුවද, එකී බැඳීම් සීමාවට සංස්ථාවේ වාර්ෂික වියදම් පිළිබඳව වන යම් ඌනතාවයක් පියවීම සඳහා සංස්ථාවේ රීති යටතේ ගෙවන ලෙස ඒ සාමාජිකයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් ආධාරයක් ඇතුළත් නො වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** කළමනාකාර සභාවේ යෝජනා සම්මුතියක බලය පිට සහ කළමනාකාර සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනාගෙන් එක් අයකු සභාපති විය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.